## රජය සහ විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනය විසින් සිදුකරන ඒකාබද්ධ ප්‍රකාශය

මාස තුනකට අධික කාලයක් තිස්සේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය විසින් පවත්වාගෙන යනු ලබන වෘත්තීය ක්‍රියාමාර්ගය අවසන් කිරීම සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය හා රජය යන දෙපාර්ශවය අතර සාධනීය එකඟතාවක් ඇතිකර ගැනීම සඳහා, අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත හා උසස් අධ්‍යාපන අමාත්‍ය එස්.බී.දිසානායක මැතිතුමාගේ ඉල්ලීම මත, ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත්වීමෙන් ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා, මුදල් අමාත්‍යාංශයේ  ලේකම් ආචාර්ය පී.බී.ජයසුන්දර මහතා ඇතුලු නිලධාරීන් සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය සිදු කළ දිගු හා ඵලදායී සාකච්ඡා වල ප්‍රතිඵලයක් ලෙස වර්ජන ක්‍රියාමාර්ගය අතහැරීම සඳහා වන පහත සඳහන් එකඟතා ගොඩනගා ගැනීමට දෙපාර්ශවයට හැකි විය.

මෙම වෘත්තීය ක්‍රියාමාර්ගය විසඳා ගැනීම සඳහා අදාළ පාර්ශව යොමු කරවීම කෙරෙහි උනන්දු වූ අනෙකුත් පාර්ශව වන අතිගරු මහානායක ස්වාමීන් වහන්සේලා, සියලුම පූජක උතුමන්ලා, වෘත්තීය සමිති, බුද්ධිමතුන්, මහජන නියෝජිතයින්, විශ්වවිද්‍යාල ප්‍රජාව සහ සිවිල් සමාජ සංවිධාන දක්වූ සහයෝගය පිළිබඳව රජයත් විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනයත් යන දෙපාර්ශවයම ප්‍රසාදය පළකර සිටී.

මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන්ව ඇති පරිදි ශ්‍රී ලංකාව දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගය ශක්තිමත් කිරීමටත් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය ඉදිරිපත් කළ ජාත්‍යන්තර නිර්නායකවලට අනුකූලවන ලෙස  අධ්‍යාපනය පිළිබඳව වූ රාජ්‍ය වියදම් වැඩි කිරීමේ යෝජනාව පිළිබඳව සැලකිලිමත් වෙමින් සහ අනෙකුත් යෝජනා ඇතුලත්වන ආකාරයටත් වූ කැබිනට් පත්‍රිකාවක් සාකච්ඡා ක්‍රියාවලියේ එක් පියවරක් ලෙස රජය විසින් අනුමත කරන ලදී.

එම කැබිනට් පත්‍රිකාවේ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලය විශේෂ වෘත්තීය කණ්ඩායමක් ලෙස සැලකීම, ඒ සඳහා කටයුතු කිරීමට විශේෂිත කමිටුවක් පිහිටුවීම, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිසංස්කරණ හා විශ්වවිද්‍යාලවල ස්වාධීනත්වය පිළිබඳව වන නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වූ විශේෂ ජනාධිපති කොමිසන් සභාවක් පත් කිරීම සහ උසස් අධ්‍යාපනය සම්බන්ධ ප්‍රතිසංස්කරණ කටයුතු වලදී විශ්වවිද්‍යාල ප්‍රජාව සමඟ ඵලදායී සංවාදයක යෙදීමේ අවශ්‍යතාව පිළිගැනීම යන කරුණු ද ඇතුලත්විය.

එසේම විශ්වවිද්‍යාලවල ශාස්ත්‍රීය නිදහස හා ස්වාධීනත්වය සුරකෙන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය එකඟතා, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය, උපකුලපතිවරුන් හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම අතර ඇතිකර ගැනීමට මෙම සාකච්ඡා තුල දී හැකි විය.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය, උපකුලපතිවරුන් හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සමඟ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා විසින් පවත්වන ලද සාකච්ඡා මාලාවේදී වර්ජන ක්‍රියා මාර්ගය අවසන් වූ පසු එකිනෙක විශ්ව විද්‍යාලවල සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය හා උපකුලපතිවරු අතර රැස්වීමක් මෙන්ම විශේෂ සෙනෙට් සභා රැස්වීමක් ද පැවැත්වීමට එකග විය. එමගින් එකිනෙක විශ්වවිද්‍යාල වල යහපත් අධ්‍යයන පරිසරයක් ගොඩනගා ගැනීම සඳහා වූ සංවාදයක් ගොඩනැංවීමට අපේක්ෂා කෙරේ. එසේම මෙම සහයෝගිතාව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වර්ෂයකට දෙවරක් උප කුලපතිවරුන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව සහ විශ්වවිද්‍යාල ආචාර්ය වරුන්ගේ සමිති සම්මේලනය අතර රැස්වීම් පැවැත්වීමට ද එකග විය.

තවද විශ්වවිද්‍යාල ආචාර්ය වරුන්ගේ සමිති සම්මේලනයේ නියෝජිතයින් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා අතර වූ සාකච්ඡාවලින් පසු 2012.10.09 දින මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විශ්වවිද්‍යාල ආචාර්ය වරුන්ගේ සමිති සම්මේලන නියෝජිතයින් වෙත ලබාදුන් ලිඛිත එකගතාව ක්‍රියාත්මක කිරීමට දෙපාර්ශවයම එකගතාව පළකර සිටි.

එසේම, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් විසින් නම්කරනු ලැබ ඇති විශ්වවිද්‍යාල ආචාර්ය ප්‍රජාවේ සාධනීය කටයුතු වලට බාධාකාරීවන චක්‍රලේඛ අහෝසි කිරීමට ද එකඟතාවක් ඇතිවිය. විශ්වවිද්‍යාලවලට බඳවාගන්නා නවක සිසුන් සඳහා වන නායකත්ව පුහුණු

වැඩසටහනේ ස්වරූපය තීරණය කිරීම සඳහා පීඨමණ්ඩල හා සනාතන සභාවල සහය ලබා ගැනීම එලඹි තවත් එකගතාවකි.

එසේම පෞද්ගලික ආයතනවලට විශ්ව විද්‍යාලවල සම්පත් භාවිත කිරීමට ඉඩදෙමින් එවන් ආයතන සමග උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ඇතිකර ගත් එකගතා ක්‍රියාත්මක කල හැකිවන්නේ පීඨමණ්ඩල සහ සනාතන සභාවල අනුමැතිය යටතේ බව දෙපාර්ශවයම පිළිගනි.

දෙපාර්ශ්වය අතර සාකච්ඡා සුහදත්වයෙන් හා අවබෝධයෙන් යුතුව සිදුකෙරුණු අතර අදාළ එකගතා ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරියටත් සුහදව කටයුතු කිරීමට දෙපාර්ශවය එකඟ වී සිටී.